සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| | | |
|---|---|---|
| **8 ශ්‍රේණිය** | **පළමු වාර පරීක්ෂණය - 2019** | **62 S** |

පුරවැසි අධ්‍යාපනය I - කොටස

**කාලය පැය දෙකයි**

නම ..............................................

●සැළකිය යුතුයි:- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
● එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමි වේ.

- **වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

01. ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසු කිරීම සඳහා .......................................... යොදාගනු ඇත.
(පොදු අවශ්‍යතා / පොදු වුවමනා/ පොදු සේවා)

02. සමාජයේ දැකිය හැකි කුඩාම හා වැදගත්ම ඒකකය ...................................................... වේ.
(පාසල / පවුල / පන්සල)

03. පරිසර සංරක්ෂණය සඳහා ...................................................... රජය පිහිටුවා ඇති ආයතනයක් වේ.
(ළමා ආරක්ෂක අධිකාරිය/ ජාතික පරිසර කමිටුව / මධ්‍යම පරිසර අධිකාරිය)

04. දරුවන් නිදහස හා ................................................ අගයන ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් විය යුතුය.
(සමානාත්මතාවය/ සහෝදරත්වය / එකමුතුකම)

05. වර්තමාන ලෝකයේ බොහෝ රටවල ක්‍රියාත්මක වන්නේ ..................................... පාලන ක්‍රමයයි.
(රාජාණ්ඩු/ ප්‍රජාතන්ත්‍රවාදී / ඒකාධිපති)

- **පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. අයහපත් චිත්තවේගී තත්වය දිගින් දිගට පැවතීම තුළ පුද්ගලයා කායික, මානසික හා සාමාජීය වශයෙන් පිරිහීමට ලක්වේ. ( )
07. මහජන ආරක්ෂාව සහතික කිරීම සන්නිවේදන ක්ෂේත්‍රයෙන් විය යුතු යුතුකමක් හා වගකීමක් වේ. ( )
08. ජාතික අවශ්‍යතාවයන්ට ගැළපෙන පුරවැසියන් බිහි කිරීම පාසල තුළින් සිදුවිය යුතු කාර්යයකි. ( )
09. ජන සමාජයේ අපේක්ෂා, අරමුණු, පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා එය මෙහෙය වීමට කාර්යශූර නායකත්වයක් අවශ්‍ය වේ. ( )
10. සමූහයක් ලෙස කටයුතු කිරීමේ දී ඉවසීම, අන් මතවලට ගරු කිරීම හා සමානාත්මතාවය වැනි ගුණාංග පුද්ගලයා තුළ වර්ධනය කර ගැනීමෙන් සමාජය තුළ ගැටුම් නිර්මාණය වේ. ( )

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වල වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. අනුරාධපුර යුගයේ දී ගම් දහයකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත්කිරීමෙන් පැහැදිලි වන්නේ,
1. පණ්ඩුකාභය රජු සමයේ සෞඛ්‍ය සේවාව පිළිබඳවය.
2. බුද්ධදාස රජු සමයේ සෞඛ්‍ය සේවාව පිළිබඳවය
3. V වන මිහිඳු රජු සමයේ සෞඛ්‍ය සේවාව පිළිබඳවය
4. ධාතුසේන රජු සමයේ සෞඛ්‍ය සේවාව පිළිබඳවය

12. බ්‍රිතාන්‍ය යුගයේ දී ආරම්භ කළ පොදු සේවාවක් වන්නේ,
1. සෞඛ්‍ය සේවාව 2. බැංකු සේවාව
3. ජල සම්පාදන සේවාව 4. ආරක්ෂක සේවාව

13. ඒකාධිපති නායකත්ව ශෛලියේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. ඒකමතික තීරණ ගැනීම 2. වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය කිරීම
3. ජනතා අදහස් පිළිගැනීම 4. ජනතා සුබසිද්ධියට කටයුතු කිරීම.

14. පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් වන්නේ,
1. වෙන් වෙන්ව තීරණ ගැනීම 2. හුදෙකලාව කටයුතු කිරීම
3. සමානාත්මතාවයෙන් කටයුතු කිරීම 4. අයිතිවාසිකම් පමණක් භුක්ති විඳීම

15. නායකයෙකු සතු ආවේදනීය හැකියාවක් වන්නේ මින් කුමක් ද?
1. සමාජශීලී බව 2. සංවේදීබව 3. සැලසුම් සහගත බව 4. ස්ථිරසාර බව

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට A, B පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**




A

16. A පින්තූරයෙන් දැක්වෙන ලාංඡනය අයත් ජාත්‍යන්තර සංවිධානය නම් කරන්න. ..........................................................................

17. එම ජාත්‍යන්තර සංවිධානය මඟින් ඉටුවන ප්‍රධාන කාර්යය කුමක් ද?

..................................................................................................................

පහත දැක්වෙන B හා C පින්තූර දෙකෙන් දැක්වෙන පවුල් වර්ග දෙක නම් කරන්න.





18. ........................................................................ 19 ..............................................................................

20. ඉහත B හා C පින්තූර වලින් දැක්වෙන පවුල් ඒකක දෙකෙන් වඩාත් හොඳින් දරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන පවුල් ඒකකය නම් කරන්න. ..........................................................................

(ල. 2 x 20 = 40 )

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01) i. පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.


A


B


C

ii. ඉහත A,B ,C පින්තූර වලින් දැක්වෙන පොදු සේවා නම් කරන්න.


A - ..........................................................................

B - ..........................................................................

C - .......................................................................... (ල. 03)



D


E

ii. a. ඉහත පින්තූර දෙකෙහි දක්නට ලැබෙන අවස්ථා නම් කරන්න.

D - ..........................................................................

E - .......................................................................... (ල. 02)

b. එම අවස්ථා ප්‍රයෝජනවත් වන්නේ කුමක් සඳහා ද? (ල. 01)

iii. අදාළ නායකත්ව භූමිකාව හා අනුනායකත්ව භූමිකාව හිස්තැන මත ලියන්න.

| නායකයා | අනුනායකයා |
|---|---|
| විදුහල්පති | A. ............................................ |
| B ..................................................... | පංතියේ සිසුන් |
| ශිෂ්‍ය නායකයා | C ..................................................... |
| D ..................................................... | පංතියේ සිසුන් |
| E ..................................................... | විෂය හදාරන සිසුන් |

(ල. 05)

iv. බෝ නොවන රෝග 2 ක් නම් කරන්න.

1. ......................................................................

2. ...................................................................... (ල. 02)

v. මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් ඔබ ප්‍රදේශයට ඉටුවන සේවා 03 ක් සඳහන් කරන්න. (ල. 03)

1. ......................................................................

2. ......................................................................

3. ......................................................................

(02) i. පොදු සේවාවල ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

1. ......................................................................

2. ......................................................................

3. ......................................................................

ii. ඔබ පාසලේ විවිධ ක්‍රියාකාරකම් වලට සහභාගීවීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාසලේ කෙරෙන ක්‍රියාකරකම් | එම ක්‍රියාකාරකම් වලින් ඔබට ලැබෙන ප්‍රයෝජන |
|---|---|
| සාහිත්‍ය සමිති පැවැත්වීම | 1. ..................<br>2. .................. |
| ශිෂ්‍ය නායක මණ්ඩලයට සම්බන්ධව කටයුතු කිරීම. | 1. ..................<br>2. .................. |
| විවාද කණ්ඩායමේ සාමාජිකයෙක් වීම | 1. ..................<br>2. .................. |
| ආගමික සමිති පැවැත්වීම. | 1. ..................<br>2. .................. |

(ල. 08)

(03) i. මගී ප්‍රවාහනය සඳහා සේවා සපයන රාජ්‍ය ආයතන 2 ක් නම් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................  (ල. 02)

ii. පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................  (ල. 03)

iii. පහත දැක්වෙන සේවාවන් හා සම්බන්ධ කාර්යයන් නිවැරදිව යා කරන්න.





1. ලිපි හා පාර්සල් යැවීම.

2. වීථි ආලෝක කිරීම.

3. මුද්දර විකිණීම.

4. විශ්‍රාම වැටුප් හා රජය සපයන ආධාර ලබාදීම.

5. වෙළඳ ආයතනවල අවශ්‍යතා සඳහා ආලෝකය ලබාදීම.

6. නිවෙස් ආලෝක කිරීම.  (ල. 06)

(04) i. ජනතාවගේ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා විශාල කාර්යභාරයක් ඉටුකරන සමුපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(ල. 02)

ii. ඔබ ප්‍රදේශයේ පිහිටි විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් ඉටුවන සේවාවන් 3 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

(ල. 03)

iii. පොදු සේවා සැපයීමේ දී මහජනතාවගෙන් සහ සේවා සපයන්නන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පොදු සේවාව | සේවා භුක්ති විඳින මහජනතාවගේ යුතුකම් | සේවා සපයන්නන්ගේ යුතුකම් |
|---|---|---|
| සෞඛ්‍යය | 1. ..........................<br>2. ..........................<br>3. .......................... | 1. ..........................<br>2. ..........................<br>3. .......................... |

(ල. 06)

(05) i. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වන ආයතන 2 ක් නම් කරන්න.

1. ........................................................................... 2. ........................................................................... (ල. 02)

ii. ප්‍රාදේශීය මට්ටමින් සේවා සපයමින් දරුවන්ගේ රැකවරණය වෙනුවෙන් කටයුතු කරන නිලධාරීන් තිදෙනෙකු නම් කරන්න.

1. ...........................................................................................

2. ...........................................................................................

3. ........................................................................................... (ල. 03)

iii. ඉහත II ප්‍රශ්නයේ ලියන ලද නිලධාරීන්ගේ කාර්යයන් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න

| නිලධාරියා | නිලධාරියාගෙන් ඉටුවන කාර්යයන් |
|---|---|
| | 1. ..........................................................<br>2. .......................................................... |
| | 1. ..........................................................<br>2. .......................................................... |
| | 1. ..........................................................<br>2. .......................................................... |

(ල. 06)

(06) i. ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතුවිය යුතු ගුණාංග 3 ක් ලියන්න.

1. ...........................................................................................

2. ...........................................................................................

3. ........................................................................................... (ල. 03)

ii. ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් කවරේදැයි නිවැරදිව යා කරන්න.

| | |
|---|---|
| අධ්‍යාපනය | A - අන් අයගේ ආගම් වලට ගරු කිරීම. |
| නිසි රැකවරණය ලැබීම | B - දෙමව්පියන්ට වැඩිහිටියන්ට ගරු කිරීම. |
| ආගමික විශ්වාසයන් ඇරීම. | C - ගුරුවරුන්ට කීකරු වීම. |
| | D - පාසලේ විනය නීතිවලට අවනත වීම. |
| | E - ආගමානුකූලව යහපත් ක්‍රියාවන්වල යෙදීම. |
| | F - මව්පියන්ට සහය දැක්වීම. |
| | G - හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම. |
| | H - මව්පියන්ගේ මිල මුදල් ආරක්ෂා කිරීම. |

(ල. 08)


(07) I. හරහට හා පහළට දක්වා ඇති උපකාරක පද උපයෝගී කරගෙන පහත දැක්වෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

2 - ළමා අයිතිවාසිකම් දක්වා ඇති ප්‍රධාන තේමාවන්ගෙන් එකකි.
3 - පොළිස් නිලධාරීන් මාර්ගය තුළ මේවා හැසිරවීමේ කටයුතුවල නිරත වනු ඇත.
5 - පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි.
6 - බෝ නොවන රෝගයකි.


<u>පහළට</u>

1 - පවුලෙන් දරුවන්ට අනිවාර්යයෙන් ලැබිය යුතු දෙයකි.
4 - බ්‍රිතාන්‍යපාලන යුගයේ මෙරට බිහිවූ සේවාවකි.
7 - මනස සන්සුන් කිරීමේ ක්‍රියාවකි.




(ල. 07)

ii. පහත දැක්වෙන චිත්තවේගී අවස්ථාවන්හි දී සිදු වන ප්‍රතික්‍රියා මොනවාදැයි සඳහන් කරන්න.




(ල. 04)

# පළමු වාර පරීක්ෂණය - 2019

# පුරවැසි අධ්‍යාපනය

# 08 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | |
|---|---|---|
| 1 - පොදු සේවා | 6 - ✓ | 11 - 2 |
| 2 - පවුල | 7 - ✗ | 12 - 2 |
| 3 - මධ්‍යම පරිසර අධිකාරිය | 8 - ✓ | 13 - 1 |
| 4 - සමානාත්මතාවය | 9 - ✓ | 14 - 3 |
| 5 - ප්‍රජාතන්ත්‍රවාදී | 10 - ✗ | 15 - 2 |

16. යුනිසෙෆ්
17. ළමා අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කිරීම.
18. න්‍යෂ්ටික පවුල
19. විස්තෘත පවුල
20. විස්තෘත පවුල

## II කොටස

(01) i. A - සන්නිවේදනය  B - සෞඛ්‍ය  C - ආරක්ෂක සේවාව

ii. a. D - භාවනා කරන අවස්ථාවක්
E - පන්සලක ආගමික වතාවත් කරන අවස්ථාවක්

b. මානසික සුවය / මනස සන්සුන් කිරීම සඳහා

iii. A - ගුරු මණ්ඩලය, සිසු දරු දැරියන්
B - පංතිභාර ගුරුවරයා
C - පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්
D - පංති නායකයා
E - විෂය නායකයා

iv. දියවැඩියාව / අධි රුධිර පීඩනය / හෘද රෝග / පිළිකා / වකුගඩු රෝග

ශිෂ්‍ය නායක මණ්ඩලය :-
❖ නායකත්වයට අදාළ ගුණාංගවර්ධනය කර ගැනීම.
❖ කණ්ඩායම් හැඟීම වර්ධනය කරගැනීම.

විවාද කණ්ඩායම් :-
❖ කථිකත්වය දියුණු වීම.
❖ කණ්ඩායම් හැඟීම වර්ධනය වීම.
❖ සාමූහිකව වැඩ කිරීමට හුරුවීම.
❖ ජය පරාජය විඳගැනීමට හුරුවීම.

ආගමික සමිති :-
❖ දහම් දැනුම
❖ ගුණ ධර්ම වර්ධනය වීම
❖ චිත්තවේග පාලනය කරගැනීමට උදව් වේ.

(වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න)

v. ළදරු හා මාතෘ සායන පැවැත්වීම.
ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
බෝවන රෝග මර්දන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. (පෙළ පොත 10 පිටුව)

(02) i. ❖ කිසිදු භේදයකින් තොරව සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගතහැකි වීම.
❖ ලාභ ඉපයීමට වඩා මහජන සුබසිද්ධිය අරමුණ කරගෙන පවත්වාගෙන යාම.
❖ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට සහය වීම. (පෙළ පොත 6 පිටුව)

ii. සාහිත්‍ය සමිති :-
❖ නිර්මාණශීලී බව වර්ධනය කරගත හැකිවීම.
❖ සහයෝගයෙන් කටයුතු කිරීමට හුරුවීම.
❖ තම හැකියා, දක්ෂතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලැබීම.

ශිෂ්‍ය නායක මණ්ඩලය :-
❖ නායකත්වයට අදාළ ගුණාංගවර්ධනය කර ගැනීම.
❖ කණ්ඩායම් හැඟීම වර්ධනය කරගැනීම.

විවාද කණ්ඩායම් :-
❖ කථිකත්වය දියුණු වීම.

❖ කණ්ඩායම් හැඟීම වර්ධනය වීම.
❖ සාමූහිකව වැඩ කිරීමට හුරුවීම.
❖ ජය පරාජය විඳගැනීමට හුරුවීම.

ආගමික සමිති :- ❖ දහම් දැනුම
❖ ගුණ ධර්ම වර්ධනය වීම
❖ චිත්තවේග පාලනය කරගැනීමට උදව් වේ.

(වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න)

(03) i. ❖ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
❖ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
ii. ❖ මාර්ග නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම.
❖ අධිවේගී මාර්ග ඉදිකිරීම.
❖ නව බස් රථ ධාවනයට එක් කිරීම. (පෙළ පොත 17 පිටුව)
iii. ❖ විදුලි බල සැපයුම - 2 / 5 / 6
❖ තැපැල් සේවාව - 1 / 3 / 4

(04) i. ' එකා සැමටත් - සැම එකාටත්'
ii. ❖ පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම.
❖ ණය පහසුකම් සැපයීම.
❖ බැංකු සේවා සැපයීම.
❖ ප්‍රවාහන සේවා සැපයීම.
❖ අවමංගල්‍ය සේවා සැපයීම. (පෙළ පොත 23 පිටුව)
iii. <u>සේවා බුක්ති විඳින මහජනයාගේ යුතුකම්</u>
❖ වෛද්‍ය උපදෙස් පිළිපැදීම
❖ සේවා සපයන කාර්ය මණ්ඩලයට කාරුණික වීම.
❖ ආයතන සතු දේපළ ආරක්ෂා කිරීම.
❖ යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම (පෙළ පොත පිටුව 30)

<u>සේවා සපයන්නනගේ යුතුකම්</u>
❖ රෝගීන්ට නිසි ප්‍රතිකාර සැපයීම.
❖ භාවිතයට සුදුසු ඖෂධ වර්ග සැපයීම.
❖ වෛද්‍ය උපදෙස් සැපයීම හා දැනුවත් කිරීම. (පෙළ පොත පිටුව 27)

(05) i. ❖ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
❖ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (පෙළ පොත 41 පිටුව)
ii. ❖ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී
❖ ප්‍රාදේශීය ළමාආරක්ෂක නිලධාරී
❖ මුල් ළමාවිය සංවර්ධන නිලධාරී (පෙළ පොත 41 පිටුව)
iii. 41, 42 පිටුවල ඉහත තනතුරු වලට අදාළ කාර්යයන් බලන්න.

(06) i. ❖ මානව හිතවාදීබව
❖ අවංක කම
❖ කැපවීම (පෙළ පොත 49 පිටුව)
ii ❖ අධ්‍යාපනය - C/ D/ G
❖ නිසි රැකවරණය - B/ F/ H
❖ ආගමික විශ්වාසයන් දැරීම - A/ E

(07) i.

| <u>හරහට</u> | <u>පහළට</u> |
|---|---|
| 2 - ආරක්ෂාව | 1 - ආදරය |
| 3 - රථ වාහන | 4 - ප්‍රවාහනය |
| 5 - සහයෝගය | 7 - භාවනා |
| 6 - දියවැඩියාව | |

ii. සතුට - සිනාසීම , ඔල්වරසන් දීම, අත්පුඩිගැසීම
කෝපය - බැන වැදීම, පහරදීම, දත්මිටිකෑම
දුක - හැඬීම, සුසුම් හෙළීම, විලාපදීම
බිය - ඇස් ලොකු වීම, ශරීරය වෙව්ලීම, ගොත ගැසීම (පෙළ පොත 43 පිටුව)